www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආර්ථිකය පිලිබඳ සිය කථාව තුල ඔබාමා වාචාලකම හා දක්ෂිණාංශික ප්‍රතිපත්ති එකට අනයි

## Obama combines demagogy and right-wing policies in speech on economy

**ඇන්ඩ්‍රි ඩෙමෝන් හා බැරී ග්‍රේ විසිනි**
**2013 ජූලි 25**

කම්කරුවන්ගේ විශ්‍රාම ගෙවීම් හා සෞඛ්‍ය සහන වැනසීම සඳහා යොදාගනිමින් ඇති ඩිට්‍රොයිට් බංකොලොත්වීම ගැන සඳහන් කිරීමට පවා අසමත්වීමේ කාරනය පමනක්ම වුවත් එලිමහනට ගෙනැවිත් ඇත්තේ, ඔබාමාගේ කථාවේ නරුම හා වංචනික ස්වභාවයයි.

ඉලිනොයිස් ගැලස්බර්ග්හි නොක්ස් විද්‍යාලයේදී 24දා ආර්ථික පිලිවෙත ගැන ජනාධිපති බරක් ඔබාමා පැවැත්වූයේ ප්‍රධාන කථාවකි. එය වනාහි, හිස් වාක්‍ය බන්ධ වලින් සැදුම්ලත් තුච්ඡ හා මුසාබස් දෙඩීමකි.

කෝටි ගනන් ඇමරිකානුවන් මුහුනපා ඇති මහා විරැකියාව, වැඩෙන දුප්පත්කම හා නැගෙන සමාජ කාලකන්නිකමට එකදු බැරෑරුම් විසඳුමක් හෝ ඔබාමා විසින් ඉදිරිපත් කලේ නැත. නගරයේ පිහිටි මේටැග් ශීතකරන කම්හල 2004දී වසා දැමූ බව නිවේදනය කල විට රැකියා අහිමිවූ කම්කරුවන් 900 දෙනා වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ඔහුට මොකුත්ම තිබුනේ නැත. මේටැග් කම්කරුවන්ට සිදුවූයේ කුමක් ද යන්න පිලිබඳව නොක්ස් විද්‍යාලය කල අධ්‍යයනයකින්, වසාදැමීමෙන් සය අවුරුද්දකට පසුව ඔවුන්ගේ මධ්‍යම තරමේ නිවෙස්න ආදායම ඩොලර් 10,000න් පහත වැටී තිබෙන බව සොයාගෙන තිබේ.

කම්කරුවන්ගේ විශ්‍රාම ගෙවීම් හා සෞඛ්‍ය සහන වැනසීම සඳහා යොදාගනිමින් ඇති ඩිට්‍රොයිට් බංකොලොත්වීම ගැන සඳහන් කිරීමට පවා අසමත්වීමේ කාරනය පමනක්ම වුවත් එලිමහනට ගෙනැවිත් ඇත්තේ, ඔබාමාගේ කථාවේ නරුම හා වංචනික ස්වභාවයයි.

අනෙක් සැම තැන්හිදී මෙන්ම මේ අවස්ථාවේදීත් ඔබාමා හා ඔහුගේ උපදේශකයෝ, කටයුතු කරන්නේ ඇමරිකානු ජනතාව අපරිමිතවම රැවටීමට පහසු හා මෝඩ පිරිසක්ය යන සිතාගැනීමට අනුවය. ඔවුන් සිතන්නේ, බැංකු වලට ඩොලර් ට්‍රිලියන ගනන් ඇප දීමෙන් පසුව, එක දවසකදී ඩිට්‍රොයිට් නාගරිකයට ආධාර කිරීම ප්‍රතික්ෂේප කර අනෙක් දවසේදී පොදු ජනතාවගේ උපදේශකයා ලෙස පෙනී සිටීමට ධවල මන්දිරයට හැකි බවයි.

ආර්ථිකය ගැන අවධානය යොදන ප්‍රචාරක වර්ගයේ රැස්වීම් මාලාවක පලමු කථාව පිටුපසින් පැවති නරුම ගනන් බැලීම්, "නිමක් නැති වික්ෂිප්ත භාවය, දේශපාලන මවාපෑම් හා ව්‍යාජ සෝලි රඟදැක්වීම" ලෙස ඔබාමාගේ හෙලාදැකීම් තුල කැටිව තිබේ. පැහැදිලිවම මෙයින් අදහස් කලේ, ජාතික ආරක්ෂක ඒජන්සියේ හිටපු කොන්ත්‍රාත්කාර එඩ්වඩ් ස්නෝඩන් විසින් සියලු ඇමරිකානුවන්ගේ ද ලෝකය පුරා ජනතාවන්ගේ ද දැවැන්ත, රහසිගත හා නීති විරෝධී ආන්ඩුවේ ඔත්තු බැලීම් පිලිබඳව කල හෙලිදරව් කිරීම් ඇතුලත් වන බවයි.

ආන්ඩුවේ මහජන සම්බන්ධතා, ආර්ථිකය වෙත කැරකවීම මගින් බොහෝ කොටම අරමුනු කරන්නේ, ස්නෝඩන්ට එරෙහි එහි දඩයම ද බ්‍රැඩ්ලි මැනිං සොල්දාදුවාට එරෙහි නීතිමය සැකිල්ල ද ඇතුලු ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ආන්ඩුවේ ප්‍රහාරය වෙතින් ජනතාවගේ අවධානය වෙනතකට හැරවීමය.

එක්සත් ජනපදයේ ව්‍යවස්ථාව ද ඇමරිකානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ද අමු අමුවේ උල්ලංඝනය කරන පොලිස් රාජ්‍ය සුපරීක්ෂක යාන්ත්‍රනයක් ගොඩනැගීමට ඔබාමා කරන යෝජනාව ඔහුගේ පාලනයෙහි ආන්තික ප්‍රතිගාමී ස්වභාවය කැටිකර දක්වන "ව්‍යාජ සෝලියකි." මූලික අයිතීන් ග්‍රහනයට ගන්නා අතර ම ජනතාවගේ ආර්ථික අවශ්‍යතා ආරක්ෂා කරන්නේය යන අදහස එහි ස්වභාවයෙන්ම අභූතයකි.

සත්‍යය නම් එහි ප්‍රතිවිරුද්ධයයි. ඔබාමා සිය කථාවේදී කයිවාරු ගසන ඊනියා "ප්‍රකෘතිය" වාර්තාගත කොටස් මිල, ව්‍යාපාරික ලාභ හා විධායකයින්ගේ වැටුප් මගින් සලකුනු කරන හා පෙර නොවූ විරූ නිර්දය භාවයකින් දුප්පත් කමට ඇද දමන කම්කරු පන්තිය සඳහා ව්‍යසනයක් වන වෝල් වීදියට හා ධනවතුන්ට පුදන තෑග්ගකි. ඔබාමා යටතේ වෙනදාටත් වඩා වේගයෙන් ඉහල නගින එක්සත් ජනපදයේ සමාජ අසමානතාවයේ මට්ටම්, ප්‍රජාතන්ත්‍රවාදය සමග

පැහෙන්නේ නැත. ප්‍රචන්ඩත්වය හා භීෂනය සමග අත්වැල් බැඳගෙන පොලිස් රාජ්‍ය ව්‍යුහයන් හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලීන් යොදාගන්නේ හරියටම, පැනනැගෙමින් ඇති සමාජ ප්‍රතිරෝධයට ප්‍රතිචාර වශයෙනි.

ඔබාමා සිය පූර්ව කථා ප්‍රතිචක්‍රීයකරනය කොට දැන් යෝජනා කර ඇති  බොහෝ කොටම වාචික පියවර, මුලුමනින්ම ප්‍රතිගාමී ස්වභාවයක් දරයි. ඊට එක්සත් ජනපද සංගත සඳහා පිදෙන බදු විරාම හා සහන මෙන්ම උසස් අධ්‍යාපනය මහා ව්‍යාපාරිකයට යටත් කිරීම ද ඇතුලත්ය.

ආර්ථික වර්ධනය ලඟාකරගැනීම පිනිස "උඩ පහලට" යන රිපබ්ලිකානුවන්ට එරෙහිව මෙන් "මැද එලියට ගැනීම" පිලිබඳ උපදේශකයා හා නියමුවා ලෙස පෙනී සිටින ඔබාමා "පොකුරු ගසන මධ්‍යම පන්තිය" ගැන කථා කරයි. මෙම වාචාල පුරසාරම් දෙඩීමේ අරමුන, ව්‍යාපාරික පාලනයේ ඇති පක්ෂ දෙකේ ආර්ථික පිලිවෙත්වල මහා වෙනසක් තිබෙන බව මවා පෑමය. යථාර්තය නම්, කාලය හා උපක්‍රම පිලිබඳ කුමන සුලු වෙනස්කම් තිබුන ද විශ්‍රාම ගෙවීම්, සෞඛ්‍ය සහන, සෞඛ්‍ය රක්ෂන හා සමාජ සුරක්ෂිත භාවය ද ඇතුලු වැඩකරන ජනතාවගේ අතීත සමාජ ජයග්‍රහන හා ජීවන තත්වයන් මත එල්ල කරන ප්‍රහාරයේදී මේසා පරිමානයේ ද්විපාර්ශවික එකඟත්වයක් කවර කලෙකවත් තිබී නැති බවයි.

"එම මහා පසුබෑම ආරම්භවී වසර පහකට පසුව ඇමරිකාව යලි ප්‍රකෘතිමත් වීම සඳහා සටනක යෙදී ඇතැයි" පවසන අතර "ආර්ථික ප්‍රකෘතිය" අගය කරන ප්‍රකාශ සමගින් ඔබාමා සිය කථාව පටන්ගත්තේය. "පසුගිය මාස 40 තිස්සේ අපගේ ව්‍යාපාරික ක්ෂේත්‍රය අලුත් රැකියා මිලියන 7.2ක් නිර්මානය කර ඇත. 1999න් පසුව පෞද්ගලික අංශයේ බලගතුම රැකියා වර්ධනය මේ වසර තුල සාක්ෂාත්කර ගැනීමට අප යොමුව සිටින්නෙමු" යයි ඔහු පුරසාරම් දෙඩීය.

සැබවින්ම නම් එක්සත් ජනපද ආර්ථිකය එහි පූර්ව පසුබෑමේ අවධියේ පැවති සේවා නියුක්ති මට්ටම් වලට වඩා බොහෝ පහලින් සිටියි. ඒ 2009 වසරේ පටන් වැඩකලහැකි වයසේ පසුවන ජනගහනය මිලියන 9.4න් වැඩිව තිබියදීය. දිගු කාලීන විරැකියාව මහා අවපාතයෙන් පසු දක්නට ලැබෙන ඉහලම මට්ටම කරා පැමින තිබේ. නව රැකියාවන්ගෙන් වැඩි කොටස වුව ද අඩු වැටුප් ගෙවන, තාවකාලික නොවේ නම් අර්ධකාලීන රැකියාවන්ය.

එක තැනකදී ඔබාමා, සමාජ අසමානතාවයේ වැඩිවීම ගැන ඉඟි කලේය. "අපගේ ව්‍යාපාර නව රැකියා නිර්මානය කරමින් ලාභ වාර්තා බිඳ හෙලා ඇති නමුදු පසුගිය දස වසරේ වැඩිවූ ආදායමේ මුලු පංගුවම වාගේ ගලා ගියේ ඉහලම සියයට 1 ජන කොටස වෙතය. 2009 පටන් සාමාන්‍ය උසස් විධායකයෙක් සියයට 40ක ආදායම් වර්ධනයක් අත්දුටුවේය. එහෙත් සාමාන්‍ය ඇමරිකානුවෙක් උපයන්නේ ඔහු හෝ ඇය 1999 ඉපැයුවාට වඩා අඩු ආදයමකි. සමාගම්, කිසියම් කාලයක් රැකියා විරහිතව සිටි අය සේවයට බඳවා ගැනීම අත්හිටුවාගෙන සිටියි."

ඔබාමා "ප්‍රකෘතියේ පලමු දෙවසර වන 2009-2011 දක්වා ජනගහනයෙන් ධනවත්ම සියයට 1 ආදායම සියයට 11න් වැඩිවූ අතරතුර අවශේෂ ඇමරිකාව පරිහානියට පත්වූ බව ද ඔහුට සඳහන් කල හැකිව තිබිනි.

කෙසේ හෝ ඔබාමා, මුදුනේ ධනය තව තවත් කඳු ගැසුනේ සිය ප්‍රතිපත්තිවල ප්‍රතිපල වශයෙන් නොවන බව ඇඟවුම් කලේය. ඒවාට, බැංකු වලට ඇප දීම, ව්‍යාපාරික බදු සහන හා මෝටර් රථ කම්කරුවන්ගේ වැටුප් කැපීම ඇතුලත්ය. ඒවා තම වැඩපිලිවෙලට රිපබ්ලිකානුවන්ගෙන් පලවූ විරුද්ධත්වය නිසා සිදුවූ දේ බව ඔහු ඇඟවුම් කලේය.

උසස් අධ්‍යාපන වියදම් නොකඩවා "ඉහලට, ඉහලට යාම" වැලැක්වීමේ මුවාවෙන් ඔබාමා, දැනටමත් කේ-12 අධ්‍යාපනයේදී භාවිතයට ගෙන තිබෙන වෙලඳපොල පදනම් කරගත් "ප්‍රතිසංස්කරන" වර්ගයක් උසස් අධ්‍යාපන මට්ටමේදී හඳුන්වා දිය යුතු යයි කියා සිටියේය.

මෙයට "උගැන්වීම අන්තර්ජාලයේ මාර්ගස්ථ අධ්‍යාපනය සමග කවලම්" කිරීමක් ද "සිසුන් කී දෙනෙක් එයට සම්බන්ධ වනවා ද යන්න මත නොව, ඔවුන් කී දෙනෙක් උපාධි ලබනවා ද හා ඔවුන් කෙතරම් හොඳින් එම කටයුත්තේ නිරතවනවා ද යන්න මත විද්‍යාල වලට අරමුදල් සපයන නව මාර්ග" ද ඊට ඇතුලත්ය.

මේවා උසස් අධ්‍යාපනය තවත් පුලුල් ලෙස මහා ව්‍යාපාරිකයන් අතට පත් කිරීම සඳහා මූල්‍ය දිරිගැන්වීම් හා අධෛර්යමත් කිරීම පිනිස හඳුන්වා දෙන දේය. මේ අතර සහනදායක ආන්ඩුවේ සිසු නය පොලිය සියයට 10කටත් වඩා ඉහල නැංවීමට ඉඩ සලසන ද්විපාර්ශවීය පනතකට ඔබාමා පාලනය පිටුබලය ලබාදෙයි.

© www.wsws.org